වගා ආධාර චක්‍රලේඛ අංක: 07

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 349, ගාලු පාර,
කොළඹ 03.
1989.01. 03 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

මාතෘකාව : පෞද්ගලික තේ ඉඩම් ලේඛණයක් පවත්වාගෙන යාම

## 1.0 චක්‍රලේඛයේ පරමාර්ථය:

1:1 නැවත වගා සහ පැළ සැපයීමේ ආධාර ක්‍රම යටතේ අවසර අනු නිකුත් කිරීම සඳහා ඉඩම තේ කොමසාරිස් අංශයේ ලියා පදිංචි කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. 1983 කුඩා තේ ඉඩම් සංගණනය අනුව දිවයිනේ මුළු කුඩා තේ ඉඩම් අතුරින් 66% ක් පමණ ලියාපදිංචි වී නොමැති බව හෝ ලියා පදිංචි තොරතුරු නොදන්නා බව හෙළිවී ඇත. ඉඩම් කැබලි කිරීම අයිතිය වෙනස්වීම වැනි කරුණු නිසා ලියා පදිංචි තේ ඉඩම්වල වුවද අංක සොයා ගැනීම නොහැකිවී ඇත. මෙවැනි නෛතික බාධක නිසා තේ වගා සහනාධාර ලබා ගැනීමට ඉල්ලුම්කරුවන්ට ඇති බාධක ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලසීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථයයි.

ඒ අනුව නැවත වගාව සහ පැළ සැපයීම යටතේ ආධාර ගෙවීම සඳහා ඉදිරියේදී මෙම තේ ඉඩම් ලේඛණය පිරික්සා යෝග්‍ය ඉඩම තේ [illegible]ද යන්න තහවුරු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

1:2 තේ වගා ලේඛණය ක්ෂුද්‍ර සංවර්ධන කාර්යයන් සඳහා පමණක් භාවිත කිරීමට අදහස් කෙරේ. 1957 අංක 51 දරන තේ පාලන පනතේ දෙවැනි වගන්තිය පරිදි, සෑම තේ ඉඩමක්ම තේ කොමසාරිස් කාර්යාලයෙහි ලියා පදිංචිවීමේ අවශ්‍යතාවය තවදුරටත් එසේම ක්‍රියාත්මක වනු ඇත.

## 2.0 ක්‍රියා පිළිවෙත:

2:1 මේ සමඟ අමුණා ඇති පී.ආර්. 1 ආකෘතිය මගින් පිටපත් 02 කින් යුතුව සෑම පෞද්ගලික තේ ඉඩමක් වෙනුවෙන්ම තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන්න. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් විසින් සිය කොට්ඨාශය තුළවූ සියලුම තේ ඉඩම් පිළිබඳව මෙම තොරතුරු රැස් කළයුතු අතර, එක් පිටපතක් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී වෙතද, අනෙක ප්‍රාදේශීය කාර්යාලයේද තබා ගන්න. වගා සහනාධාර පරීක්ෂණ සහ ව්‍යාප්ති කටයුතු යොදා ගන්නා අවස්ථාවේදීම හෝ වෙනම යොදා ගත් ක්ෂේත්‍ර පරීක්ෂණ ලෙස හෝ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්ට සිය ප්‍රදේශයේ ඇති

තේ ඉඩම් පිළිබඳව මෙම තොරතුරු රැස්කළ හැකිය. ප්‍රදේශයේ තේ ඉඩම් පිළිබඳ මඟ පෙන්වීමක් ලෙස භාවිත කිරීම පිණිස 1983 කුඩා තේ ඉඩම් සංගණනයේ ඉඩම් නාම ලේඛණය ප්‍රාදේශීය කාර්යාලය මගින් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් වෙත සැපයීමට කටයුතු කරන්න.

2:2 තේ ඉඩමක් ලෙස තේ වගා ලේඛණයේ සටහන් කළ යුත්තේ පහත දැක්වෙන කරුණු සපුරාලන ඉඩම්ය.

(අ) ආදායම් ලබන තේ වගාවක් සහිත ඉඩමක්වීම හෝ

(ආ) සටත් පිරියෙයින් හෙක්/පඳුරු 2500 (අක්. 1 පඳුරු 1000) ක් සහිත ආදායම් ලබන හෝ අත්හැර දමා ඇති ඉඩමක් වීම හෝ

(ඇ) පැරණි/අත්හැර දැමූ ඉඩම්වල පැරණි කණු, ගල්වැටි, මැරුණු තේ කඳන් වැනි තේ වගාවක් පැවති බවට සාධක තිබීම හෝ

(ඈ) අලුතින් තේ වගා කරන ඉඩම්වල අවසාන වාරිකය ගෙවීමට නිර්දේශ කරන තේ ඉඩම්.

2:2:1 කෙසේ වෙතත් එකම ඉඩම එක් වරකට වඩා ලේඛණයට ඇතුළත් කිරීම වැළැක්වීමට පියවර ගන්න.

2:3 <u>ලේඛණය පිළියෙල කිරීම:</u>

2:3:1 ප්‍රාදේශීය කාර්යාලයට ලැබෙන සම්පූර්ණ කළ පී.ආර්.1 ආකෘති පත්‍ර ඉඩමේ පිහිටීම අනුව දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය, ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශය සහ ගම අනුව වර්ග කරන්න.

ඒ අනුව ගම් අනුව එකී ආකෘති පත්‍ර වෙන වෙනම ගොනුගත කර, අංක 01 සිට අනු අංක දෙන්න.

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී සතුව ඇති පිටපත් ද මේ ආකාරයට ගම් අනුව ගොනුගත කොට තබා ගන්න.

2:3:2 එක් ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශයකට එක් ලේඛණයක් වන පරිදි පී. ආර්. 2 ආකෘතියේ දැක්වෙන තොරතුරු ඇතුළත් තේ වගා ලේඛණයක් ගම් අනුව පවත්වා ගන්න. ගොනුගත කරන සෑම ආකෘති පත්‍රයක්ම වෙනුවෙන් කොරතුරු පවත්වා ගන්න. ගොනුගත කරන සෑම ආකෘති පත්‍රයක්ම වෙනුවෙන් තොරතුරු එම ලේඛණයේ ඇතුළත් කරන්න. උදා: ලෙස එක් ග්‍රාම සේවා කොට්ඨාශයක ගම් 06 ක් තිබේ නම් එම එක් එක් ගමක තොරතුරු වෙන වෙනම ඇතුළත් කිරීමට හැකිවන ලෙස බෙදා වෙන්කර ගන්න. පිටු ඇමිණිය හැකි වන පරිදි මෙම ලේඛණය (Loose Leaf Register) පවත්වා ගැනීම පිණිස අවශ්‍ය පී. ආර්. 2 ආකෘති ඔබ වෙත සපයනු ලැබේ.

2:4 <u>තේ ඉඩම් සඳහා අංක යෙදීම:</u>

ලේඛණයේ ඇතුළත් කරන තේ ඉඩම් සඳහා අංක යෙදීම පහත සඳහන් අනුපිළිවෙල අනුව සිදු කරන්න.

| දිස්ත්‍රික්ක කේත අක්ෂරය | ප්‍රා. උ. දි. කේත අංකය | ග්‍රා. සේ. නි. කේත අංකය | ගම කේත අංකය | ඉඩමේ අනු අංකය |
|---|---|---|---|---|

2:4:1 දිවයිනේ තේ වගා කරන පරිපාලන දිස්ත්‍රික්ක සඳහා පහත දැක්වෙන කේත අක්ෂර යොදා ගන්න.

| දිස්ත්‍රික්කය | කේත අංකය | දිස්ත්‍රික්කය | කේත අංකය |
|---|---|---|---|
| ගාල්ල | GA | මහනුවර | KN |
| මාතර | MT | මාතලේ | ML |
| හම්බන්තොට | HM | කුරුණෑගල | KR |
| රත්නපුර | RT | කෑගල්ල | KG |
| බදුල්ල | BD | කළුතර | KL |
| නුවරඑළිය | NE | කොළඹ | CM |
| | | මොණරාගල | MG |

2:4:2 එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක යටතේ ඇති පුද්ගලික තේ ඉඩම් සහිත ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ ඒ යටතේ ඇති ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ සහ එක් ග්‍රාම සේවා කොට්ඨාශයක් යටතේ ඇති ගම් සඳහා 1983 කුඩා තේ ඉඩම් සංගණනයේදී භාවිතා කළ කේත අංකම යොදන්න.

එම සංගණනයේදී භාවිතා කළ කුඩා තේ ඉඩම් පිහිටි ගම් ලේඛණය ඔබ කාර්යාලයේ නොමැති නම් මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

2:4:3 ඇතැම් ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ, ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ සහ ගම් එකී ලැයිස්තුවේ සඳහන් ආකාරයට වඩා දැනටමත් වෙනස්වී හෝ කලින් කල වෙනස්වීම් ඇතිවීමට පුළුවන. එවිට එකී සංශෝධනයන් වර්තමාන කේත අංකයට උප අක්ෂරයක් යෙදීමෙන් වෙන්කොට දැක්වීමට කටයුතු කරන්න.

උදා: ලෙස ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ අංක 05 සහ 06 එක්ව ග්‍රාමසේවා කොට්ඨාශ 03 ක් ලෙස කැඩී ඇත්නම් අංක යෙදීම 05. 05 ඒ, සහ 06 ලෙස කළහැකිය.

2:4:4 <u>අංක යෙදීම පිළිබඳ උදාහරණයක්:</u>

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශයේ දෙඩම්පේ ග්‍රාම සේවා කොට්ඨාශයේ මිල්ලකඳේ ගමේ ඇති තේ ඉඩමක් සඳහා අංක යෙදිය යුත්තේ:

ආර්ටී/09/02/09/ඉඩමේ අනු අංකය ලෙසටය.

2:4:5 ලේඛනගත ඉඩමක් කැබලිවන අවස්ථාවකදී අලුත් කැබලි මුල් ලේඛනගත අංකය ඉදිරියෙන් ඒ,බී,සී යනුවෙන් අලුත් අනු අංකයන් යටතේ සඳහන් කළයුතුය. තවද මුල් ලේඛනගත අංකය සහිත තීරුවේ වෙනස් කරුණු යටතේ එකී කැබලි අයත් අනු අංක සහිතව සටහන් යෙදිය යුතුය.

/.. 04

3.0 **ක්‍රියාත්මක කිරීම:**

(අ) තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් මගින් පී.ආර්. 1 ආකෘතියේ පුද්ගලික තේ ඉඩම් පිළිබඳ තොරතුරු රැස්කිරීම නොපමාව ආරම්භ කරන්න.

(ආ) පී.ආර්. 1 සම්පූර්ණකර, ප්‍රාදේශීය කාර්යාලයට ලැබෙන පරිදි ඉහත සඳහන් කර ඇති පරිදි අංක යොදා පී.ආර්. 2 ලේඛණයේ සටහන් කරන්න.

(ඇ) පී.ආර්. 1 සහ පී.ආර්. 2 මුද්‍රිත ආකෘති ඔබවෙත සපයනු ලැබේ. පී.ආර්. 1 ආකෘතිය මුද්‍රණය කර සපයන තෙක් මෙහි දැක්වෙන ආකෘතිය පරිදි රෝනියෝ කර භාවිතා කරන්න. තේ ඉඩම් ලේඛණය ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශ අනුව අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය බැවින්, පී.ආර්. 2 ආකෘති පිටපත් එකතු කර ගත හැකිවන ලෙස අවශ්‍ය ගොනු කවරද සපයනු ලැබේ.

(ඈ) තවද මෙසේ ලේඛණගත කරන සෑම ඉඩමකම අධිකාරියේ ලේඛණගත අංකය එම ඉඩම හිමිකරු වෙත දන්වා යවන්න.

4.0 මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සහ තේ කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව බව සැලකිය යුතුය.

[signature]

වී.ජේ.නානායක්කාර
සභාපති.

පිටපත්:-
1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
2. තේ කොමසාරිස්
3. සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
5. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
6. අභ්‍යන්තර විගණක
7. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
8. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

89-01-27 දිනදී [illegible]